**දශක තුනක් තිස්සේ උතුරේ පැවැති යුද්ධයේ අවසාන දින කිහිපය තුළදී රජයේ හමුදාවන්ට බාරවූ එල්.ටී.ටී.ඊ. ඉදිරි පෙළ සාමාජිකයන් අතර එම සංවිධානයේ දේශපාලන අංශයේ කාන්තා නායිකාව තම්ළිනී ජෙයක්කුමාරන් ද විය. යුද ජයග්‍රහණයෙන් පසුව රජය ක්‍රියාත්මක කළ පුනරුත්ථාපන වැඩ පිළිවෙළ යටතේ නැවත සමාජ ගත කෙරුණු ඇය ඉන් වසර කිහිපයකට පසුව මහරගම පිළිකා රෝහලේදී ජීවිතක්ෂයට පත්වූයේ පිළිකා රෝගියෙකුවය. පිළිකා රෝගයට ගොදුරුව මරණය අභිමුව සිටියදී ඇය එල්.ටී.ටී.ඊ. සංවිධානය හා සම්බන්ධ සිය ක්‍රියාකාරකම් සහ බිහිසුණු අත්දැකීම් පිළිබඳ තබන ලද ලිඛිත සටහන් පසුව දෙමළ භාෂාවෙන් පොතක් ලෙස ප්‍රකාශයට පත් කෙරිණි. එහි ඇතුළත් කරුණු දෙමළ සමාජය තුළ මහත් විවාදයටද, බාහිර සමාජයේ මහත් අවධානයටද ලක්වීය.**

**අතිමහත් සමාජ පිරිවැයක් දරමින් එල්.ටී.ටී.ඊ. යුද සංවිධානය වැනසීමට රජයේ හමුදා සමත් වුවද, එම සංවිධානයේ නැඟීමට සහ පැවැත්මට බලපෑ හේතු නැසීමට රජය මෙතෙක් සමත්වී නැත. උතුරේ දෙමළ ජාතිවාදයද, නැඟෙනහිර මුස්ලිම් ජාතිවාදයද, දකුණේ සිංහල ජාතිවාදයද මේ මොහොතේ නව වටයකින් හිස ඔසවමින් සාමකාමී පුරවැසි සමාජයට සන්නිවේදනය කරන පනිවිඩයද බෙහෙවින් භයානකය. එවැනි පසුබිමක මද අස්වැසිල්ලක් භුක්තිවිඳිමින් සිටින දැනුම්වත් සිංහල පුරවැසි සමාජයට තම්ළිනීගේ මරණාසන්න ස්මරණය මගින් ලබාදෙන පනිවිඩයේ ඇති සුවිශේෂීත්වය සළකා එහි සිංහල පරිවර්තනය කොටස් වශයෙන් ඔබ වෙත ගෙනඑන්නෙමු.**

**තම්ළිනී දෙමළ බසින් තැබූ සටහන් සිංහලයට නැඟූ ආචාර්ය ස්වාමිනාදන් විමල් සහ ඒ සඳහා අවශ්‍ය සෙසු සම්පත්දායකත්වය සැපයූ සිනමාවේදී ධර්මසිරි බණ්ඩාරනායක දෙපළට මෙහිදී අපගේ විශේෂ ස්තුතිය පිරිනමමු.**

සන්නසට සකස් කරන්නේ - ශ්‍රීලාල් සෙනෙවිරත්න



# තම්ළිනීගේ කතාව 11

දිවි පිදූ මහ විරුවරියක වූ චන්ද්‍රනායකීගේ නමින් කාන්තා පෙරමුණ කිලාලි මුහුදු වෙරළෙහි කොහු කර්මාන්ත ශාලාවක් පිහිටුවා තිබුණි. පොල් වතුවල ඇති පොල් ලෙලි එකතුකර මාස හයක පමණ කාලයක් මුහුදු වෙරළේ වැල්ලේ වළ දමා තැබිය යුතුය. පසුව ඒවා රැගෙන තළා, කොහු රැගෙන, ලණු- කොහු ආදිය නිෂ්පාදනය කළ යුතුය. මෙම සැළැස්මේ අරමුණ වූයේ එම ගමේ කාන්තාවන්ට රැකියා අවස්ථා සපයා දීමය. ඒ සමඟම එම ගමට අදාළව සංවිධානයේ කටයුතු සිදුකළ යුතුය. මෙවැනි වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම කිසිසේත්ම පෙර අත්දැකීම් නොමැතිව සිටි මා හට ආරම්භයේදී මහත් දුෂ්කර කාර්යයක් ලෙසින් හැඟුණි. නමුත් එම ගමේ අත්දැකීම් සහිත වැඩිහිටියන්ගේ උපදෙස් ලබාගෙන එක් එක් කටයුත්ත සම්පූර්ණ කළ පසුව මා තුළ ස්වයං විශ්වාසය සහ උනන්දුව ඇති විය. එම ගමේ කාන්තාවෝ දස දෙනෙක් එහි වැඩ කළෝය. ඔවුන්ට මාසයකට රුපියල් තුන්දාහක් බැගින් පමණක් වැටුප් ලබා දීමට හැකි තත්ත්වයක් පැවතීම ඔවුන්ට මහත් උපකාරයක් විය.

මේ ගමෙහි කාන්තා සංවිධානයක් පිහිටුවා එම සංවිධානයේ පාලනය යටතේ ළදරු පාසලක් ද ප්‍රාථමික සෞඛ්‍ය මධ්‍යස්ථානයක්ද ස්ථාපිත කළෙමු. කිසිම සටන්කාමී සහෝදරයෙකුගේ උපකාරයකින් තොරව පොදු ජනයාගේ උපකාරයෙන් සටන්කාමී සහෝදරියන් දෙදෙනෙකු මගින් මෙම වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීමට හැකි විය.

අලිමංකඩ සහ පුනගරී යන ප්‍රදේශවල රැඳී වුන් හමුදාව කිලාලි හරහා යාපනයට ගමන් කිරීමට උත්සාහ දැරුවොත් එවැනි පියවරක් වැළැක්වීම සඳහා කිලාලි මුහුදු වෙරළ ප්‍රදේශයෙහි විමුක්ති කොටින්ගේ කාන්තා බලඇණිය ස්ථානගතව උන්හ. එකසිය පනහකින් යුතු එම බල සේනාව භාරව උන්නේ සෙන්පති විදූෂාය. මම මගේ ජීවිතයෙහි පළමු වරට ඇයව හමුවූයේ එහිදීය. මූලික පුහුණුව පවා ඒ වන විට ලබා නොතිබූ නවක සටන්කාමී සාමාජිකාවන් වන අපි එම ගමෙහි මහත් උනන්දුවකින් යුතුව වැඩ කිරීමත්, ජනතාව සහ අප අතරෙහි පැවැති ශක්තිමත් සම්බන්ධතාවත් ගැන විදූෂා තුළ පුදුමයක් ඇති කළා විය හැකිය.

## තුන් මසක අවි පුහුණුව අවසන් විය

ඇය සවස් යාමයන්හි අපව කැඳවා කතාබහ කිරීම නිතර සිදු කළාය. මුහුදු වෙරළේ සිදු කරන තම කණ්ඩායමේ තුවක්කු වෙඩි පුහුණුවලට ඇය අපවද සම්බන්ධ කරගත්තාය. තනිව සිටි දේශපාලන සටන්කාමී අප වෙත ඇය මහත් උනන්දුවක් සහ අවධානයක් යොමු කළාය. එම කාලය තුළ මහත් දැඩි සේ පැතිරෙමින් පැවති මොළේ මැලේරියා උණට මම ද ගොදුරු වුණෙමි. එවිට ඇය මාව වහාම රෝහල් ගත කර අවශ්‍ය ප්‍රතිකාර ලබා දෙමින් මා සුවවන තෙක් දැඩි අවධානයකින් යුතුව කටයුතු කළාය.

පසුව මට කිලාලියෙහි සිට මාරුවක් ලැබිණි. නීතිය සහ පරිපාලනය පිළිබඳව ඉගෙන ගැනීම සඳහා තෝරාගත් සටන්කාමී සහෝදරියන්ගෙන් මා ද එක් අයෙකි. එම අවස්ථාවේ කාන්තා බල සේනාවේ විශේෂ සෙන්පතිනි අපව හමුවූවාය. මූලික පුහුණුව ලබා නොමැති අය ටික දෙනා බැගින් පුහුණුවට යවන්න කියලා නායකතුමා කිව්වා. ඒ හින්දා මේ ළමයින්ව ඉස්සෙල්ලා පුහුණුවට යවන්න ඕනෑ යැයි ඇය කීවාය. පසුව කිලාලි හි පිහිටි සෝදියා කඳවුරේ ආරම්භ කිරීමට නියමිතව තිබූ පුහුණුව සඳහා දේශපාලන කටයුතුවල යෙදී සිටින සටන්කාමී සහෝදරියන් පනස් දෙදෙනෙකු යැවීමට කටයුතු සූදානම් කළාය.

ඒ අනුව සෝදියා කඳවුරේ 21 වන කණ්ඩායමට අයත්ව පුහුණුව ලැබීමට 1992 අප්‍රේල් මාසයෙහි මා යැව්වාය. එහි පුහුණුව සඳහා මගේ නැගණිය ද පැමිණ සිටිනු මම එහිදී දුටුවෙමි. මගේ වෙන්වීමෙන් අපේ පවුලේ අය වින්ද වේදනාව ඇය මට දීර්ඝ ලෙස විස්තර කළාය. මට සංවිධානයෙන් ඉවත් වන මෙන් ඉල්ලා සිටි ඇය මා වෙනුවට ඇය සංවිධානයෙහි කටයුතු කරන බව පවසා අඬන්නට වූවාය. මම නැගණියව අස්වැසුවෙමි. අප මෙන් කී දාහක් දෙනා සටන්කාමීන් ලෙස සිටින්නේද යන්නත්, නිකරුණේ මැරිලා යනවාට වඩා සටන්කර මිය යාම යහපත් බවත් මම පැහැදිලි කළෙමි. ඇය සහ මම එක්කුස උපන් සහෝදරියන් වූ බව පුහුණු කඳවුර භාරව සිටි අය සහ අනෙකුත් පුහුණුකරුවෝ දැන උන්හ. එහෙයින් අප දෙදෙනා එක්ව කතාබහ කිරීමත්, නිතර එකට සිටීමත් සංවිධානයේ භාවිතයට නොගැළපෙන බව මම මගේ නැගණියට පැහැදිලි කළෙමි. අප මෙන් ඥාතීන්ගෙන් වෙන්ව පැමිණ සිටින අනෙකුත් සටන්කාමී සහෝදරියන්ගේ හැඟීම් පෑරෙන අයුරින් කටයුතු නොකළ යුතු බව මගේ නැගණියද තේරුම් ගත්තාය. ඊට පසුව පුහුණු කාල සීමාවෙහිදී නැගණිය සමඟ කතා බහ කිරීමෙන්ද, ඇයව හමුවීමෙන් ද මම වැළකුණෙමි. දුෂ්කර පුහුණුවීම්වලදී ඇය වේදනා විඳීම හෝ පුහුණුකරුවෙකුගේ දඬුවමට ලක්වීම හෝ මම මගේ දෑසින් නොදැකිය යුතුය යන්නෙහි මම දැඩි තීරණයක උන්නෙමි. මගේ නැගණිය පුහුණුවීම්වලදී ද වෙනත් කටයුතුවලදී ද මහත් විශිෂ්ට ලෙසින් කටයුතු කර පුහුණු කණ්ඩායමෙහි නායිකාව බවට පත්වීම දක්වා ප්‍රගතියක් අත්කර ගත්තාය.

අපේ පුහුණු කඳවුරේ දෙසිය හැටක පමණ පිරිසක් සිටිති. සෑම දිස්ත්‍රික්කයකටම අයත් පිරිස් ඒ අතර වූහ. වයස අඩු අයද උන්හ. අපේ පුහුණු ගුරුවරු පිටියේදී ඉතාමත් දැඩි අය ලෙස කටයුතු කළත්, සෑම සටන්කාමී සාමාජිකාවකගේම පුද්ගලික කරුණු පිළිබඳවත් මහත් උනන්දුවක් දැක්වූහ. උදේ හයට ආරම්භ වන දිවීමේ සහ ශාරීරික අභ්‍යාසය අවසන් වන්නේ නවයටය. එයට පසුව එළඹෙන පැයක විවේකයේදී දිගු පෝලිමකට එකතුවී ආහාරය සහ තේ පැන් ලබාගත යුතුය. පසුව නැවතත් දහයේ සිට දොළහ දක්වා ආයුධ පුහුණු පන්ති පැවැත්වෙයි. එයට පසුව හරියටම මධ්‍යාහ්න දොළහේ සිට එක දක්වා ගිනියම් වැලි තලයෙහි දී ඉරියව් පුහුණුවීම් පන්ති පැවැත්වෙයි. දාදිය ගංගා ගලන ගමන් වේගයෙන් ඉරියව් පුහුණුව ලැබිය යුතුය. ඉන්දීය හමුදාව භාවිත කළ ීසෑ තුවක්කුව මහත් දිගය. අපේ පුහුණු ආයුධය වූයේ එයයි. රැයක් දවාලක් වෙනසක් නොමැතිව දිගටම පැවැති පුහුණුවීම් සටන්කාමී සහෝදරියන්ව හෙම්බත් කිරීමට සමත් විය. ඉරිදා දිනය නිවාඩු දිනයක් වූ අතර රාත්‍රී කාලයෙහි කලා වැඩසටහන් පැවැත්වෙයි. කාන්තා බලඇණියෙහි පළමු කණ්ඩායමට අයත් අක්කා කෙනෙක් ප්‍රධාන පුහුණුකාරිය ලෙස කටයුතු කළාය. වෙනත් පුහුණු කඳවුරුවලදී මෙන් පුහුණුව ලබන්නන්ට පහර දීම, දැඩි දඬුවම් ආදිය අපගේ කඳවුරේ එතරම් වූයේ නැත. එයට වෙනස්ව යමින් ඇය අධික වේලාවක් පුහුණුව ලබන්නියන් සමඟ ගත කළාය. ඇයව දකින විටම බියක් ඇති වන අයුරින් ඇය හැසිරුණා මිස ඇයගේ පෞද්ගලික ප්‍රවේශයන් මඟින් ඇය සටන්කාමී සහෝදරියන් දැඩි පාලනයකට ලක්ව තබාගන්නට සමත් වූවාය. ස්වීය මගපෙන්වීම් පෞර්ෂය ඇය සතු විය. තුන් මසක පුහුණුව අවසන් විය. අමතර පුහුණුව සඳහා අපව සටන් පසු පෙරමුණ වෙත යැවීය. යාපනයෙහි අරියාලෙ ප්‍රදේශයේ සටන්කාමී සහෝදරියෝ ස්ථානගතව උන්හ. එම ප්‍රදේශ සඳහා වන දිගු දුර අගල් ද, සාමාන්‍ය බංකර ද ඉදිකිරීම් සඳහා මගේ නායකත්වයෙන් පනස් දෙනෙකුගේ කණ්ඩායමක් යැවීය. අපි එහි වැඩකටයුතු සිදුකරමින් සිටි අවස්ථාවේ කුමක් හෝ

**36** වන පිටට



සුභාවිත ගීතයේ අන්තර්ජාල නවාතැන - තිසර ගුවන්විදුලිය www.thisara.com